# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය

### නීතිවේදී උපාධි පරීක්ෂණය, සිව්වන වසර - 2020

### නීති විද්‍යාව
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **07**

ප්‍රශ්න <u>හතරකට</u> **(04)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. ඔස්ටින්ගේ ශෛලියේ සහ ඉදිරිපත් කරන ක්‍රමවේදයෙහි දැකගත හැකි සියලු නොමිහිරි ගුණාංග පැවතියද, පොදු නීති රටවල දහස් සංඛ්‍යාත මිනිසුන්හට නීති විද්‍යාව නැමැති ලෝකය ගවේෂණය සහ තවදුරටත් එසේ කිරීමට ඔස්ටින්ගේ කාර්යය තුළින් ද්වාරයක් විවර කොට තිබේ.

   W.L. Morrison , *John Austin* (London: Edward Arnold, 1982) 192.

   උක්ත ප්‍රකාශය ඇසුරෙන් ජෝන් ඔස්ටින් විසින් සිදුකරන ලද දායකත්වය සහ නූතන නීති න්‍යායයන් කෙරෙහි එහි බලපෑම සැකෙවින් අගයන්න.

   (ලකුණු 25)

2. විවිධ වර්ගයේ රීති වල ආධාරයෙන්, සංකීර්ණ නීති පද්ධතියක් තුළ නීතීන්හි අවිනිශ්චිතතාවය (uncertainty), ප්‍රගමනය නොවීම (stagnation) සහ අකාර්යක්ෂමතාවය (inefficiency) සම්බන්ධයෙන් වන ගැටළු නිරාකරණය කිරීම සඳහා එච්. එල්.ඒ. හාර්ට් උත්සාහ කළේ කෙසේදැයි පැහැදිලි කරන්න.

   (ලකුණු 25)

3. කිසිදු බාහිර සාධකයකින් දූෂිත නොවූ නමුත් ඉහළ නියාමයන්ගෙන් වලංගුතාවය ලැබූ පිවිතුරුභාවය මත පදනම් වූ න්‍යායකට පක්ෂව කෙල්සන් තර්ක කරයි. කෙසේ නමුත් යම් නීති පද්ධතියක ඉහළම නියාමය වෙත පැමිණි විට පිවිතුරුභාවය යන සංකල්පය අභියෝගයට ලක්වේ.

කෙල්සන්ගේ න්‍යාය නූතන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රජාතන්ත්‍රවාදයන් තුළ කොතෙක් දුරට අදාල වේදැයි සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අවම වශයෙන් උදාහරණ දෙකකින් තහවුරු කරන්න.

(ලකුණු 25)

4. එක්කෝ (අ) කොටසට නැත්නම් (ආ) කොටසට පිළිතුරු සපයන්න.

(අ) COVID 19 වැනි වසංගත පාලනය සහ තුරන් කිරීම, සමාජයේ පොදු යහපත උදෙසා තනි පුද්ගල අයිතිවාසිකම් (rights) සහ හිමිකම් (entitlements) සීමා කිරීම හා සම්බන්ධ වේ. මේ උදෙසා සමාජයේ විවිධ කොටස්වල ගැටෙන බැඳියාවන් සලකා බලමින් ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් භාරගෙන තිබෙන තුලනය කිරීමේ කර්තව්‍යයක් අවශ්‍ය කරයි. මෙම කර්තව්‍යයේදී විනිසුරුවන්ගේ සමාජ සවිඥානිකභාවයද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත.

නීතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක ගුරුකුලයේ දෘෂ්ටිකෝණය තුළින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 25)

අ.පි.බ

හෝ

(ආ) සමාන අයිතිවාසිකම්, නිදහස සහ අවස්ථාවන් සියලුම මිනිසුන්ට සහතික කරන සාධාරණ සමාජයක් ස්ථාපනය කිරීමට රෝල්සියන් යුක්තිය පිළිබඳ අනුවාදය අරමුණු කරයි. කෙසේ නමුත්, ඔහුගේ න්‍යාය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් රෝල්ස් විසින් යෝජනා කරන ලද යාන්ත්‍රණයෙහි ප්‍රායෝගිකත්වය පිළිබඳව සමහරු බොහෝ සැක පහළ කරති.

ඔබ එකග වන්නේ ද? සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

5. තාර්කික බුද්ධිය මත පදනම්ව නීතියේ විශ්වීය පදනම අනාවරණය කරගැනීමේ අභිලාෂය පිළිබඳව සැක කිරීම විවේචනාත්මක නීති න්‍යායයෙහි මධ්‍යගත තේමාවයි.... නියතතාවයේ මිත්‍යාව යන්න විවේචනාත්මකව නීතියට පහර දීමේ වැදගත් සංඝටකයකි.

විවේචනාත්මක නීති අධ්‍යන ව්‍යාපාරයේ දායකත්වයන් සහ සීමාවන් පරික්ෂා කරමින් මෙම අදහස විචාරන්න.

(ලකුණු 25)

6. යම් තීරණයක් සමස්තයක් ලෙස ප්‍රජාවේ ඇතැම් සාමූහික ඉලක්කයන් ආරක්ෂා කරන බව හෝ අභිවර්ධනය කරන බව පෙන්වීමෙන් ප්‍රතිපත්ති තර්කයන් (arguments of policy) එම තීරණය සාධාරණීකරණය කරනු ලබයි. යම් තීරණයක් තනිපුද්ගල හෝ කණ්ඩායම් අයිතිවාසිකම් ගරුකරන බව හෝ සුරක්ෂිත කරන බව පෙන්වීමෙන් මූලධර්ම තර්කයන් (arguments of principle) එම තීරණය සාධාරණීයකරණය කරනු ලබයි.

Ronald Dworkin, *Taking Rights Seriously* (Harvard University Press, 1978) 82.

සුදුසු උදාහරණ යොදාගනිමින් ඩෝකින්ගේ අයිතිවාසිකම් න්‍යාය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි උක්ත ප්‍රකාශය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

7. (අ) සහ (ආ) යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) පශ්චාත් නූතනවාදය යන්න තාර්කික බුද්ධිය (rationalism) පිළිබඳව වන විශ්වාසය ප්‍රතික්ෂේප කරන්නක් සහ යම් තර්කයක් කෙතරම් පරිපූර්ණව තර්කානුකූල වුවද එය එහි පූර්වානුමානයන් පමණක් වන බවට හඳුනා ගන්නකි. ඔවුන් තාර්කිකත්වය ප්‍රතික්ෂේප කිරීමත් සමඟම සත්‍යය සොයා ගැනීමට ඇති හැකියාව ප්‍රතික්ෂේප කිරීමද පැමිණෙයි.

නූතන සමාජය තුළ යුක්තියේ ඵල භුක්ති විඳීමේදී ආන්තීකරණයට ලක් වූ කණ්ඩායම්වල දුක්ඛිත තත්ත්වය ඉහත ප්‍රකාශය කොතෙක් දුරට නිරූපණය කරන්නේද යන්න පිළිබඳව අදහස් දක්වන්න. ඔබගේ සාකච්ඡාව උදෙසා ශ්‍රී ලාංකීය සමාජය වෙත ඔබගේ අවධානය යොමු කළ හැකිය.

(ලකුණු 12.5)

අ.පි.බ

(ආ) නීති ප්‍රතිසංස්කරණ තුළින් නීති පද්ධතියක අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීමේදී සලකා බැලිය හැකි තනි න්‍යායයක් නොමැති වීම කාන්තාවාදී නීති න්‍යාය තුළ පවතින ගැටළුවයි.

කොතෙක් දුරට මෙය ශ්‍රී ලංකාවේ තත්ත්වය වේද යන්න සාකච්චා කරන්න. ඔබ තෝරා ගත් කාන්තාවාදී නීති ගුරුකුලය මතු කරන ගැටළු ආමන්ත්‍රණය කිරීමට ඉතා ඉක්මනින් කළ යුතු නීති ප්‍රතිසංස්කරණ වර්ගය කුමක්ද?

(ලකුණු 12.5)

*****